සියලුම හිමිකම් ඇවිරිණි]
முப்பு பாதிப்புஜரிமையஜடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය පිරිවෙන් අධ්‍යාපන අංශය -/ Ministry of Education – Division of Piriven Education / கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு

**පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2025**

**5 ශ්‍රේණිය**

| 07 | S | I,II |
|---|---|---|

**පැය එකයි.**

**(07) ඉතිහාසය - I, II**

**අමතර කියවීම් කාලය - විනාඩි 10**

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍ර කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

**ඉතිහාසය - I පත්‍රය**

**සැලකිය යුතුයි:**

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40ක් ලැබේ.**
- **අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.**
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැපයෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
- **එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.**

- **අංක 01 සිට 15 තෙක් එක් එක් ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර තෝරන්න.**

01. මහාවංස ගාථාවන්ගේ ඇතැම් පදවල අර්ථ විග්‍රහ කර ලියා ඇති කෘතිය කුමක් ද?
   (1) වංසත්ථප්පකාසිනි   (3) දීපවංසය
   (2) ථූපවංසය   (4) බෝධි වංසය

02. ලංකාව හා වයඹ දිග ඉන්දියාව අතර පැවති වෙළඳ සබඳතා විස්තර කරන ග්‍රන්ථය කුමක් ද?
   (1) ඉන්ඩිකා   (3) පර්සියානු යුද්ධය
   (2) භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය   (4) ඩිමුන්ඩෝ

03. අධිකරණ කටයුතු පිළිබඳ තොරතුරු ඇතුළත් IV වන උදය රජතුමාගේ ලිපිය කුමක් ද?
   (1) මිහින්තලා පුවරු ලිපිය   (3) සෝමාවතී පුවරු ලිපිය
   (2) කළුදිය පොකුණ පුවරු ලිපිය   (4) ගල්පොත පුවරු ලිපිය


www.pirigana.lk

04. අනුරාධපුර යුගයේ මහ වැව් ඉදිකිරීම ඇරඹූ පාලකයා කවු ද?

(1) ඉලනාග (3) වසභ

(2) ධාතුසේන (4) මහසෙන්

05. අනුරාධ ග්‍රාමය අංග සම්පූර්ණ අගනගරයක් බවට පත් කළ පාලකයා කවු ද?

(1) මහසෙන් (3) වළගම්බා

(2) ධාතුසේන (4) පණ්ඩුකාභය

06. පැරණි ශ්‍රී ලංකාවේ විදේශීය වෙළඳ කටයුතු වලදී ප්‍රධාන තැන ගනු ලැබූ දකුණු වෙරළේ පිහිටි පැරණි වරාය මින් කුමක් ද?

(1) ගෝකණ්ණ (3) ගොඩවාය

(2) මහාතිත්ථ (4) දේවනගර

07. අඩතැනිතලා කලාපයට අයත් ශේෂ කන්දක් වන්නේ,

(1) නමුණුකුල ය. (3) රිටිගල ය.

(2) සමනල කන්ද ය. (4) කිරිගල් පොත්ත ය.

08. පෘතුග්‍රීසි පාලනයක් යටතේ දොන් ජුවන් පෙරිය බණ්ඩාර නමින් බෞතීස්ම කොට කතෝලික ආගමට හරවා ගනු ලැබූ කෝට්ටේ පාලකයා කවුරුන් ද?

(1) හයවන පරාක්‍රමබාහු (3) අටවන වීර පරාක්‍රමබාහු

(2) හත්වන බුවනෙකබාහු (4) ධර්මපාල

09. ලන්දේසි පාලනයේ පෙරදිග මූලස්ථානය මින් කුමක් ද?

(1) බතාවිය (3) මදුරාසිය

(2) කැලිකට් (4) කොළඹ

10. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ කිතුල්ගල බෙලිලෙන වර්තමානයේ පිහිටා ඇති දිස්ත්‍රික්කය කුමක් ද?

(1) රත්නපුර (3) කෑගල්ල

(2) කළුතර (4) මහනුවර

11. වැවක අතිරික්ත ජලය මුදා හැරීම සඳහා භාවිත කළ තාක්ෂණික අංගය කුමක් ද?

(1) පිටවාන (3) සොරොව්ව

(2) රළපනාව (4) බිසෝකොටුව


www.pitigala.lk

12. පැරණි ජනතාවගේ ඇඳුම් පැළඳුම් හා ආභරණ පිළිබඳ තොරතුරු ලබාගත හැකි මූලාශ්‍රය වන්නේ මින් කුමක් ද?

(1) චිත්‍ර
(2) මැටි බඳුන්
(3) කාසි
(4) සාහිත්‍ය කෘති

13. රෝම ශිෂ්ටාචාරයේ මුහුදට අධිපති දෙවියන් හඳුන්වන නම කුමක් ද?

(1) වීනස්
(2) නෙප්චූන්
(3) කිබලේ
(4) ජූනෝ

14. ලංකාවේ මෙහෙණි සසුන ස්ථාපිත කිරීමට පුරෝගාමී වූයේ කවුරුන් ද?

(1) අනුලා දේවියගෙනි
(2) ඛේමා බිසවගෙනි
(3) භද්දකච්චායනා කුමරියගෙනි
(4) සුහලා බිසවගෙනි

15. අනුරාධපුරය අයත් වූයේ,

(1) රුහුණු රටට ය.
(2) මලය රටට ය.
(3) මායා රටට ය.
(4) රජරටට ය.

➢ **අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් හතර බැගින් ලබා දී ඇත. ඒවා අතරින් එක් නමක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ නොගැළපේ. එම නොගැළපෙන නාමය තෝරන්න.**

16. (1) ථූපාරාම සෑය
(1) ලංකාරාම සෑය
(3) ජේතවන සෑය
(4) සේල චෛත්‍යය

17. (1) මහවැලි ගඟ
(2) අඹන් ගඟ
(3) කළු ගඟ
(4) වළවේ ගඟ

18. (1) සුගලා දේවිය
(2) විහාර මහා දේවිය
(3) අනුලා දේවිය
(4) සෝමා දේවිය

19. (1) මහියංගනය
(2) මහනුවර
(3) සේරුවාවිල
(4) මහානාගහුල

20. (1) මහා පද්ම නන්ද රජු
(2) මෞර්ය චන්ද්‍රගුප්ත රජු
(3) බින්දුසාර රජු
(4) අශෝක රජු


www.pirugha.lk

➢ **අංක 21 සිට 25 තෙක් ප්‍රශ්නවල නාම /ප්‍රකාශන යුගල හතර බැගින් ලබා දී ඇත. ඒවා අතරින් එක් නාම /ප්‍රකාශන යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන නාම /ප්‍රකාශන යුගලය තෝරන්න.**

21. (1) මහාසේන - මින්නේරිය
(2) ධාතුසේන - කලා
(3) වසභ - මහවිලච්චි
(4) නාච්චදූව - මානවම්ම

22. (1) ලිච්ඡවී - වේසාලි
(2) විදේහ - මිථිලා
(3) මෞර්ය - පිප්ඵලිවනය
(4) භග්ගවරු - අල්ලකප්ප

23. (1) දන්තුරේ සටන - පේරෝලෝපේස් ද සූසා
(2) බලන සටන - ජෙරනිමෝ ද අසවේ
(3) රන්දෙනිවල සටන - කොන්ස්තන්තීනු ද සා
(4) ගන්තෝරුව සටන - අපොන්සු පෙරෙයිරා ද ලසර්දා

24. (1) දෙවන පරාක්‍රමබාහු - දඹදෙණිය
(2) තුන්වන පරාක්‍රමබාහු - යාපහුව
(3) දෙවන බුවනෙකබාහු - කුරුණෑගල
(4) හයවන පරාක්‍රමබාහු - කෝට්ටේ

25. (1) යාපහු පර්වතය - සුභ සෙන්පති
(2) ගෝවින්දමලය - බුවනෙකබාහු ආදිපාද
(3) ගංදෙනි පර්වතය - සංඛ සෙනෙවි
(4) දඹදෙණිය - කුට්ඨක සෙනෙවි


www.pmgura.lk

➢ **අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති (A), (B), (C) හා (D) යන ප්‍රතිචාර හතරක් දී ඇත. ඒවා අතුරින් දෙකක් නිවැරදිය. එම නිවැරදි ප්‍රතිචාර දෙක තෝරන්න.**

26. ලංකාව ඉන්දියාවෙන් වෙන්ව පිහිටීම නිසා හටගත් බලපෑම්,

A. ස්වාධීන රාජ්‍යයක් වශයෙන් වර්ධනය වීම.

B. දකුණු ඉන්දියානු ආක්‍රමණ ඇති වීම.

C. ඉන්දියාව සමඟ විවාහ සබඳතා ඇති වීම.

D. බුදු දහම ඉන්දියාවෙන් අතුරුදහන් වුවත් ලංකාවේ සුරක්ෂිත වීම.

1. A සහ B ය 2. B සහ C ය 3. C සහ D ය 4. A සහ D ය

27. ධාතුසේන රාජ්‍ය සමය හා පසු යුගය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශ නිවැරදි ද?

A. අනුරාධපුර රාජධානියේ දෙවන මෞර්ය වංශයේ ආරම්භකයා වීම.

B. මෙතුමා විසින් "අලිසාර" නම් ඇළක් කරවන ලදී.

C. මෙතුමා විසින් කන්තලේ සහ ගිරිතලේ වැව් ඉදිකිරීම.

D. ධාතුසේන රජතුමාගේ අග බිසවගේ පුත්‍රයා මුගලන් නමින් රජ විය.

1. A සහ B ය 2. B සහ C ය 3. C සහ D ය 4. A සහ D ය

28. අනුරාධපුරයේ ගෘහ නිර්මාණ හා කලාව සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශ නිවැරදිද?

A. ගෘහ නිර්මාණ සඳහා බහුලව කළු ගල් භාවිතා කර තිබීම.

B. අභයගිරිය මේ සමයේ ඉදි වූ විශිෂ්ට මූර්ති නිර්මාණ දැකිය හැකි ස්ථානයක් වීම.

C. සඳකඩ පහනේ කැටයම් නිර්මාණ සඳහා චෝළ බලපෑම පිළිඹිබු කිරීම.

D. විශිෂ්ටතම නිර්මාණ බහුලව දැකිය හැක්කේ ථූපාරාමයෙනි.

1. A සහ B ය 2. B සහ C ය 3. C සහ D ය 4. A සහ D ය

29. ශ්‍රී ලංකාව ඉන්දියාවට ආසන්නව පිහිටීම නිසා ඇති වූ බලපෑම් සම්බන්ධයෙන් කවර ප්‍රකාශ නිවැරදි ද?

A. ඉන්දියාව සමඟ විවාහ සබඳතා ඇති වීම.

B. බුදු දහම සුරක්ෂිත ලෙස ආරක්ෂා වීම.

C. සිංහල භාෂාවේ ප්‍රභවය හා වර්ධනය වීම.

D. ඉන්දියානු රජවරු ලංකාවේ රජවරුන්ගෙන් යුධ ආධාර ලබා ගැනීම.

1. A සහ B ය 2. B සහ C ය 3. C සහ D ය 4. A සහ D ය


www.pirigana.lk

30. වජ්ජී රාජ්‍යයේ ලිච්ඡවී පාලකයින් අනුගමනය කළ සප්ත අපරිහානි ධර්ම සම්බන්ධයෙන් කවර ප්‍රකාශ නිවැරදි වේ ද?

A. නිතර නිතර රැස්වී සාකච්ඡා පැවත්වීම.

B. සමඟිව රැස්වීම හා සමඟිව විසිර යාම.

C. සියලුම වැඩිහිටි පුරවැසියන් පාලනයට සම්බන්ධ වීම.

D. අස්වැන්න සම සමව බෙදා ගැනීම.

1. A සහ B ය   2. B සහ C ය   3. C සහ D ය   4. A සහ D ය

➢ **අංක 31 සිට 36 දක්වා ඇති නාම/ ප්‍රකාශන සමූහයේ X හා Y තීරුවල දී ඇත. X තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන Y තීරුවේ නාම /ප්‍රකාශන සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. X තීරුවේ ඒවා Y තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙලට සකස් කළ විට ලැබෙන නිවැරදි පිළිතුරු තෝරන්න.**

31.

| X | Y |
|---|---|
| 1. දුටුගැමුණු | A. පොලොන්නරුව |
| 2. නිශ්ශංකමල්ල | B. මහනුවර |
| 3. දෙවන බුවනෙකබාහු | C. අනුරාධපුරය |
| 4. කීර්ති ශ්‍රී රාජසිංහ | D. කුරුණෑගල |

1. ABDC   2. BCAD   3. CADB   4. DCBA

32.

| X | Y |
|---|---|
| 1. සෙනපති | A. භාණ්ඩාගාරික |
| 2. බඩගරික | B. දොරටුපාලක |
| 3. දෝවාරික | C. ඡත්‍රය දරන්නා |
| 4. ඡත්තග්ගාහක | D. සේනාපති |

1. ABDC   2. BDCA   3. CABD   4. DABC


www.pmgura.lk

33. X Y

| X | Y |
|---|---|
| 1. සිබවලඳ හා සිබවලඳ විනිස | A. පොලොන්නරුව |
| 2. කව්සිළුමිණ | B. කෝට්ටේ |
| 3. කාව්‍යශේඛරය | C. අනුරාධපුරය |
| 4. අමාවතුර | D. දඹදෙණිය |

1. ADBC 2. BCAD 3. CDBA 4. DBAC

34.

| X | Y |
|---|---|
| 1. මෙගස්තිනිස් | A. චීන ජාතිකයෙකි. |
| 2. ප්ලිනි | B. ඉංග්‍රීසි ජාතිකයෙකි. |
| 3. ජෝන් ඩොයිලි | C. ග්‍රීක ජාතිකයෙකි. |
| 4. හියුං සියැං | D. රෝම ජාතිකයෙකි. |

1. ABDC 2. BCAD 3. CDBA 4. DACB

35.

| X | Y |
|---|---|
| 1. වසභ | A. නාච්චදූව වැව |
| 2. පණ්ඩුකාභය | B. නොච්චිපොතාන |
| 3. මහසෙන් | C. අභය වැව |
| 4. දෙවන මොග්ගල්ලාන | D. කවුඩුල්ල වැව |

1. ABDC 2. BCDA 3. CABD 4. DABC


www.pirugha.lk

36. **අංක 36 සිට 40 දක්වා ඇති එක් එක් ප්‍රශ්නයෙහි ප්‍රකාශ දෙක බැගින් ඇතුළත් වේ. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1,2,3,4 යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා ඊට අදාළ අංකය සලකුණු කරන්න.**

| වරණ අංකය | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 2 | නිවැරදි ය. | වැරදි ය. |
| 3 | වැරදි ය. | වැරදි ය. |
| 4 | වැරදි ය. | නිවැරදි ය. |

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| **36** | මිහිඳු මහ රහතන් වහන්සේ ඇතුළු පිරිස උත්තිය රජු දවස ලංකාවට වැඩම කරවූහ. | දළදා වහන්සේ ලංකාවට රැගෙන එන ලද්දේ වළගම්බා රජු දවසය. (……) |
| **37** | පළමු විජයබාහු රජතුමා පළමුවන පරාක්‍රමබාහු රජුගේ අනුප්‍රාප්තිකයෙකු විය. | පොළොන්නරුවේ රජවීමට පළමු විජයබාහු රජු සුභලා දේවි සමඟ සටන් වැදුනි. (……) |
| **38** | විජය කුමරුගේ ඇමතිවරු අනුරාධගාම, විජිතගාම, උපතිස්සගාම පිහිටුවා ගත්හ. | රජරට ලංකාවේ බහුලව ආදිම යුගයේ ජනාවාස පිහිටි ප්‍රදේශයකි. (……) |
| **39** | චෝළ ආක්‍රමණ අනුරාධපුර රාජධානිය බිඳ වැටීමට ප්‍රධාන හේතුව විය. | චෝළයන් නව අගනුවර ලෙස තෝරාගත්තේ ජනනාථ පුරයයි. (……) |
| **40** | මෙරට පැරණි තාක්ෂණයේ විශිෂ්ට අංග අතර පැරණි රෝහල් ඉතා වැදගත් අංගයකි. | පැරණි වෛද්‍ය තාක්ෂණය සම්පූර්ණයෙන්ම පැමිණ ඇත්තේ බටහිර යුරෝපා රටවලිනි. (……) |


www.pimpura.lk

සියලුම හිමිකම් ඇවිරිණි]
முப்பு பாதிப்புஜரிமையஜடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය පිරිවෙන් අධ්‍යාපන අංශය -/ Ministry of Education – Division of Piriven Education / கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு

**පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2025**

**5 ශ්‍රේණිය**

| 07 | S | II |
|---|---|---|

**පැය දෙකයි**

**(07) ඉතිහාසය - II පත්‍රය**

**සැ. යු.**

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **මෙම කොටසට ලකුණු 60 ක් හිමි වේ.**

01. I. ඔබට සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමේ පහත සඳහන් ස්ථාන ලකුණු කර නම් කරන්න.

1. ගෝකණ්ණ 2. අනුරාධපුරය 3. වලවේ ගඟ
4. මහනුවර 5. මාගම 6. කලා වැව

(නිවැරදි ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 1 X 6 = 06)

II. (අ) A වලින් දැක්වෙන රූපය කුමක් ද?

(ආ) මෙම නිර්මාණය පිහිටි ඓතිහාසික නගරය කුමක් ද?

(ඉ) මෙම නිර්මාණය ඉදිකරවන ලද රජතුමා කවරෙක් ද?



(ලකුණු 03)

A රූපය

III. (අ) B වලින් දැක්වෙන රූපය කුමක් ද?

(ආ) මෙම රූපය හමුවෙන ඓතිහාසික නගරය කුමක් ද?

(ඉ) මෙම රූපයෙන් පෙන්නුම් කරන පැරණි තාක්ෂණය කුමක් ද?



(ලකුණු 03)

B රූපය


www.piriven.lk

02. I. අනුරාධපුර යුගයේ රචිත පාලි වංශකථා දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. පහත සඳහන් ඓතිහාසික සිද්ධීන් වලට සම්බන්ධ අනුරාධපුර පාලකයන් වරහන් තුළින් තෝරා ලියන්න.

a) මහා කළු සිංහලයා යන විරුදයෙන් හඳුන්වන පාලකයා

b) දන්ත ධාතුන් වහන්සේ වැඩම කළ සමයේ පාලනය ගෙන යාම

c) ශ්‍රී මාර ශ්‍රී වල්ලභ ආක්‍රමණයට මුහුණ දුන් රජු

d) මින්නේරිය වැව ඉදිකිරීම

(දේවානම්පියතිස්ස, දුටුගැමුණු, මහසෙන්, වළගම්බා, කීර්ති ශ්‍රී මේඝ, ධාතුසේන, පළමුවන සේන, දෙවන සේන) (ලකුණු 04)

III. අතීතයේ මෙරට රටවැසියා වෙනුවෙන් රජු සිදු කළ වැදගත් සේවා දෙකක් නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

03. I. මිහිඳු මහරහතන් වහන්සේ විසින් මෙරටදී දේශනා කරන ලද සූත්‍ර දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. මිහිඳු හිමියන් සමඟ මෙරටට වැඩම කළ ධර්ම දූත පිරිසෙන් සිව් දෙනෙකු සඳහන් කරන්න.

(ලකුණු 04)

III. මහින්දාගමනයෙන් අප ලද දායාද කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

04. I . ලංකාවේ සාපේක්ෂ පිහිටීමට බලපෑ කපොලු දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. මුල් ආර්ය ජනාවාස පිහිටුවා ගත් වියළි කලාපීය ගංගා හතරක් නම් කරන්න. (ලකුණු 04)

III. අනුරාධපුර යුගයේ මෙරට වැසියා සතුව ඉතා දියුණු වෙළඳ හා වාණිජ කටයුතු පැවති බව කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

05. I. දුටුගැමුණු රජුගේ පියා සහ සහෝදරයා නම් කරන්න. (ලකුණු 02)

II. දුටුගැමුණු රජුගේ යුධ ජයග්‍රහණයට කාවන්තිස්ස රජු ලබා දුන් සහයෝගය කරුණු දෙකක් මඟින් පෙන්වා දෙන්න. (ලකුණු 04)

III. දුටුගැමුණු රජතුමා මෙරට ඉතිහාසයේ ශ්‍රේෂ්ඨ පාලකයකු බව කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 06)


www.pirivena.lk

06. I. I වන විජයබාහු රජතුමා පිළිබඳ තොරතුරු ලබා ගත හැකි සෙල්ලිපි දෙකක් නම් කරන්න. ලකුණු 02)

II. මෙතුමාට ලංකාව එක්සේසත් කිරීමේදී සහාය වූ සේනාපතිවරු දෙදෙනෙකු නම් කරන්න.

(ලකුණු 04)

III. I වන විජයබාහු රජුගේ ආගමික සේවය කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

07. I. අනුරාධපුර රාජධානියේ සිංහාසනයට පත් වූ කාන්තාවන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

II. පොළොන්නරුව අගනුවර වශයෙන් තෝරා ගැනීමට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න.

(ලකුණු 04)

III. පොළොන්නරු යුගයේ කලාව හා ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

08. පහත දැක්වෙන මාතෘකා දෙකක් ගැන කෙටි ඓතිහාසික සටහන් ලියන්න.

1. පණ්ඩුකාභය රජතුමා
2. අනුරාධපුර රාජධානියට එල්ල වූ චෝළ ආක්‍රමණ
3. ධාතුසේන රජතුමා මුහුණ දුන් අභියෝග
4. අනුරාධපුර යුගයේ මහ වැව්

(ලකුණු 6 x 2 = 12)


www.pirivena.lk